# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2392/16 – 2024 ජූලි මස 08 වැනි සඳුදා – 2024.07.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2017/85.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

අන්තර් විශ්වවිද්‍යාල උපශාලාධිපතිවරුන්ගේ සංගමය, මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද, මොරටුව.

සහ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල අනගාරික ධර්මපාල මාවත, අංක 32/26 එල්, එම්.එම්.අයි.ආර්.ඒ.ජයතිලක මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනුෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 ජුනි මස 20 වැනි දින,
කොළඹ දී ය.


1A – G42187 – 14 (2024/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/05/2017/85.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

අන්තර් විශ්වවිද්‍යාල උපශාලාධිපතිවරුන්ගේ සංගමය, මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද, මොරටුව.

සහ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''විශ්වවිද්‍යාල උපශාලාධිපතිවරුන්ගේ නිවාඩු හා වැඩමුරය සම්බන්ධ පහත කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේ ද , යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.

1. සති අන්ත හා රජයේ නිවාඩු දිනක දී වුවද නිවාඩු ලබා ගැනීම සඳහා ආයතන ප්‍රධානීන්ගේ අනුමැතිය අවශ්‍ය වීම.
2. නිවාඩු ලබා ගැනීමේදී ආවරණ නිලධාරියකු යොදා ගැනීමට දුෂ්කරතා පවතී නම් ඒ සඳහා විසඳුම් ලබා නොදීම.
3. රාජකාරී ස්වභාවය අනුව සති අන්ත හෝ රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනයන් හි සේවයේ යොදවන්නේ නම් ඒ සඳහා කිසියම් දීමනාවක් හිමි ද හිමි නම් එය ලබා නොදීම. ''

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 28 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 0069

---

මගේ අංකය: IR/COM/01/2022/197.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ඩී.සී.ජයසිංහ මයා, 727/1ඩී, මුත්තෙට්ටුගොඩ පාර, තලංගම උතුර, බත්තරමුල්ල.

සහ

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොලොන්නාව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත

අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, රාජගිරිය , ඔබේසේකරපුර, ඇසල උද්‍යාන පාර, 46/7, අහමඩ් ලෙබ්බේ මොහොමඩ් සලීම් මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 ජූලි මස 02 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2022/197.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඩී.සී.ජයසිංහ මයා, 727/1ඩී, මුත්තෙට්ටුගොඩ පාර, තලංගම උතුර, බත්තරමුල්ල.

සහ

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොලොන්නාව.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි සේවය කරන ඩී.සී.ජයසිංහ මහතාහට එම ආයතනයේ එච්.ආර්.එෆ්.143 දරන අභ්‍යන්තරික නිවේදනයට අදාළව, B - 1 ශ්‍රේණියේ කළමනාකරණ සහකාර (ප්‍රසම්පාදන) තනතුරට උසස්වීම් පිරිනැමීමට අදාළ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ දී අසාධාරණයක් සිදුවී ඇත්ද යන්නත්, අසාධාරණයක් සිදුවී ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ. ''

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජූනි මස 25 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 - 0070

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.